# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2226/30 - 2021 මැයි මස 05 වැනි බදාදා - 2021.05.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2021 අංක 445/2

ජනා. කා. අංකය : සීඑස්ඒ/5/9/1 - 2 වෙළුම.

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනතින් සංශෝධිත 460 වන අධිකාරිය වන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 19(1) හා (2) වන වගන්ති ප්‍රකාරව, අතිගරු ජනාධිපතිතුමා විසින් වර්ෂ 2021ක් වූ ජනවාරි මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවුරුදු තුනක කාලයක් සඳහා අංක 2213/50 හා 2021.02.05 දිනැති ගැසට් නිවේදනය මගින් පත්කරන ලද ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ දැනට සාමාජිකයෙකු ලෙස කටයුතු කරනු ලබන නීතිඥ මල්ලිකා මොහොට්ටාල ලියනගේ මහත්මිය වර්ෂ 2021ක් වූ මාර්තු මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එම මණ්ඩලයේ උප සභාපති ලෙස පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

2021 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

05 - 294

1A - G 34289 — 30 (2021/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*